**ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය, එම අමාත්‍යාංශය යටතේ වූ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා සංගම් පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය.**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයෙහි අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශිර්ෂවලට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශිර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව |
| - | ක්‍රීඩා සංගම් |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 136 | ක්‍රීඩා අමාත්‍යාංශය | 2015 සැප්තැම්බර් 09 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 2015 සැප්තැම්බර් 09 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,464.47 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,422.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 332.04 ක් හා රු.මිලියන 709.50 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක් හා සියයට 31 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 136 | 1,210.32 | 878.28 | 332.04 | 27.43 |
| 219 | 2,254.15 | 1,544.65 | 709.50 | 31.48 |
| **එකතුව** | **3,464.47** | **2,422.93** | **1,041.54** | **30.06** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 53 ක ප්‍රතිපාදන ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු අතර අමාත්‍යාංශය විසින් එම මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 13601 | 5.00 | 4.11 | 2.80 | 6,22 | 24.00 | 12.28 |
| 21901 | 8.01 | 8.01 | 4.00 | 5.49 | 30.00 | 26.74 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.108,672 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 25.7 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0048/000 | 25.6 |
| ක්‍රීඩා සංවර්ධනදෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0100/000 | 167.4 |
| **එකතුව** | | **193.7** |

### 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 5 ඡේද ය දක්වා වූ ඡේදවල ස කර ඇත.

## 3. ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) | චෙක්පත්, මුදල් ඇණවුම් ලේඛනය. | මුදල් රෙගුලාසි 451 | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය. | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ඉ) | ප්‍රසම්පාදන කමිටුවේ පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඊ) | ප්‍රසම්පාදන කමිටුවල රැස්වීම් වාර්තා. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (උ) | බැරකම් පිළිබඳ ලේඛනය. | මුදල් රෙගුලාසි 214 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඌ) | වාහන ලොග් පොත් | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (එ) | වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනය. | මුදල් රෙගුලාසි 1647(ඉ) | යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.2 විගණන සාක්ෂි නොවීම

------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ජාතික ඔලිම්පික් කමිටුව හා ක්‍රීඩා සංගම් වෙත රු.68,167,465 ක් ගෙවා තිබුණද, වියදම් රජයේ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලව වැය කළ බව තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශය ලබා ගෙන නොතිබුණි. එසේම වියදම් වාර්තා ලබාගෙන අරමුදල් උපයෝජනයේ ඵලදායීත්වය සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක්ද සිදු කර ඇති බව තහවුරු කිරිමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු නොකර අමාත්‍යාංශය විසින් මාධ්‍ය ලේකම්වරයකු වෙනුවෙන් කුලියට ගෙන තිබූ රථයක් වෙනුවෙන් 2014 වර්ෂය සඳහා රු.474,000 ක කුලියක් ගෙවා තිබුණද, අදාළ වාහනයේ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වෙසක් සතිය තුළ අමාත්‍යාංශ ගොඩනැගිල්ල විදුලි ආලෝකකරණය කිරීම වෙනුවෙන් පුද්ගලික ආයතනයකට රු.350,000 ක මුදලක් ගෙවා තිබුණි. ඊට අදාලව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

## 3.3 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු අග්‍රිම සීමාවන් අනුව ඒ ඒ මාසවලදී අපේක්ෂා කළ පරිදි අග්‍රිම අමාත්‍යාංශය වෙත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නොතිබුණි. එසේම ඇණවුම් කර තිබුණු භාණ්ඩ අමාත්‍යාංශය වෙත නොලැබීම නිසා ගෙවීම් සිදු නොකිරිම හේතුවෙන් වැය විෂයයන් 34 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදන සියයට 11 ක සිට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් උපයෝජනය කිරිමට අමාත්‍යාංශයට නොහැකි වි තිබුණි.

## 3.4 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 11 කට අවස්ථා 20 කදී එකතුව රු.341,616 ක් වු තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා යටතේ සිටින නිලධාරියෙකු හැර වෙනත් පාර්ශවයකට අතුරු අග්‍රිම නිකුත් කිරීමේදි රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, එසේ ලබා ගත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශයේ ක්‍රීඩා අරමුදල හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නමින් අවස්ථා 02 කදී එකතුව රු.290,700 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ඇ) ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය කාර්ය නිමවීමෙන් පසු වහාම නිරවුල් කළ යුත් වුවත්, අවස්ථා 25 කදී ලබා දි තිබුණු එකතුව රු.563,563 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 15 ක සිට මාස 5 ක් දක්වා තාල පරාසයක ප්‍රමාදයන් කර අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වුවත්, එයට පටහැනිව අවස්ථා 03

කදී නිලධාරීන් 03 දෙනකුට රු.20,000 ක අතුරු අග්‍රිම සීමාව ඉක්මවා එකතුව රු.228,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

**3.5 පොදු තැන්පත් ගිණුම**

-----------------------

වර්ෂ 2 ක කාලය ඉක්මවූ එකතුව රු.12,535,034 ක තැන්පතු 32 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි

**3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------

විෂය අංක 13601 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට අදාල 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී එදිනට ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා සේවය හැරගිය නිලධාරින්ගෙන් අයවිය යුතු මාස 6 ක සිට වර්ෂ 2 ක් දක්වා කාල පරාසයක් සිට පැවත එන එකතුව රු.451,335 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා සිදු කළ යුතු පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-------------------------------------

**3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

--------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ මූලධන වියදම් සම්බන්ධ විස්තර පෙන්වා නොතිබුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ක්‍රීඩා වෛද්‍ය ආයතනය සඳහා රු.මිලියන 83.72 ක ප්‍රතිපාදන සළසා තිබුණද එය ක්‍රියාකාරී සැලැස්මේ රු.මිලියන 58.73 ක් ලෙස රු.මිලියන 25 ක් අඩුවෙන් දක්වා තිබුණි. එසේම අමාත්‍යාංශයේ පරිපාලන සහ ආයතන සේවා සඳහා රු.මිලියන 727.57 ක ප්‍රතිපාදන සළසා තිබුණද එය ක්‍රියාකාරී සැලැස්මේ රු.මිලියන 227.58 ක් ලෙස දක්වා තිබුණි.

**3.7.2 අභ්‍යන්තර විගණනය**

----------------------

අමාත්‍යාංශය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු. 1,210,320,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, අමාත්‍යාංශය සතුව එකතුව රු.212,336,744 ක වත්කම්ද විය. එහෙත් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයෙන් ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි.

**3.8 බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශයේ 2014දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයට අඩු බැරකම්වල වටිනාකම රු.95,473,193 ක් වූ අතර වැය විෂයයන් 9 කට අදාල එකතුව රු.36,220,788 ක්වූ බේරුම් නොකළ බැරකම් සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමෙහි දක්වා නොතිබුණි.

**3.9 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විස්තරකර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | . |
| XV පරිච්ඡේදයේ 11.1 වගන්තිය | 698,660 | ගුවන් ගමන්වලදී සියලු නිලධාරින් පිරිමැසුම් පන්තියේ ගමන් කළයුතු වුවද, ඊට පටහැනිව ව්‍යාපාරික පංතියේ ගුවන් ගමන් ටිකට්පත් මිලදී ගෙන තිබුණි |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 103 (1) | - | වාහන අනතුරු සම්බන්ධයෙන් අදාළ නිලධාරින් පොලිසියට වාර්තා කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර පාඩු හා හානි ලේඛනයේද සටහන් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | 22,480,768 | 2010 සිට 2014 වර්ෂවලට අදාළ, මාස 06 ක කාලය ඉකුත් වූ චෙක්පත් 65 ක් සම්බන්ධයෙන් |

මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 880 - ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප ලබා ගැනිමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 1646 - සංචිත වාහන සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 1647 (ආ) - වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සමීක්ෂණයක් පැවැත්විමට කටයුතු කර නොතිබුණි.

(vi) මුදල් රෙගුලාසි 1647 (ඉ) - අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් මෝටර් වාහන ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

(i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛ 2.2.11 ඡේදය - සෑම මාස 06 කට වරක් ඉන්ධන පරික්ෂාවක් සිදුකල යුතු වුවද අමාත්‍යාංශයේ වාහන 41 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි.

(ii) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 චක්‍රලේඛය - අමාත්‍යාංශයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදීමට අමතරව අමාත්‍යාංශයේ නමද සටහන් කිරිමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

**------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 5ඡේදය | 822,000 | ශරීර සුවතා ඒකකය විසින් 2014 ජූලි 30 සිට 2015 මැයි 18 දින දක්වා රැස්කර තිබූ ලියාපදිංචි හා මාසික ගාස්තු ඒකාබද්ධ අරමුදලට බැර නොකර තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. |
| (ii) | 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 1,425,660 | විදේශ ගමන් සඳහා යානාපත්‍ර මිලදී ගැනීම හා මිලදී ගැනීම් කටයුතු සෑම විටම අනුමත සමාගම් වලින් කල යුතු වුවද ඊට පටහැනිව මිලදී ගැනීම් පුද්ගලික සමාගම් වලින් කරවාගෙන තිබුණි. |

**(ඉ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛය**

**-------------------------------------**

2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන චක්‍රලේඛයේ

| | | | |
|---|---|---|---|
| - | 3.1 ඡේදය | | අමාත්‍යවරයා වෙනුවෙන් වෙන්කල හැකි උපරිම වාහන සංඛ්‍යාව 03 ක් වුවද. වාහන 09 ක් වෙන්කර තිබුණි. |
| - | 5.7 ඡේදය | 100,000 | අනුමත ඉන්ධන සීමාව ඉක්මවා අතිරේක ඉන්ධන සඳහා මුදල් වැයකර තිබුණි. |

## 3.10 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

**-----------------------------------**

අයවැයගත ප්‍රතිපාදන නොමැතිව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන අනුගමනය නොකර ක්‍රීඩා සමාජ අතර බෙදාහැරීම සඳහා එකතුව රු.39,061,290 ක කැරම් බෝඩ් සහ දාම් බෝඩ් 14,000 ක් මිලදීගෙන තිබුණි. එම භාණ්ඩ භාරගත් බව ගබඩා භාරකරු විසින් අත්සන් කර

සහතික කර තිබුණත්, එම භාණ්ඩ භෞතිකව පරීක්ෂා කර තොග ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි.

**3.11 ගැලපුම් කළයුතු ශේෂ**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු | |
| | | රු. | රු. | රු. |
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 246,401 | 5,125 | 251,526 |
| (ii) | හඳුනා නොගත් බැර | 150,359 | - | 150,359 |

**3.12 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අනතුරක් හේතුවෙන් වාහනයකට වූ හානියෙන් පසු එහි අළුත්වැඩියා සඳහා රු.355,816 ක් වැයකර තිබුණි. එම අලාභහානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ බවට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාහන අනතුරුවලට අදාල අලුත්වැඩියා බිල්පත් රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමේදී, අදාල ගනුදෙනු අමාත්‍යාංශයේ ගිණුම්වලින් බැහැරව ප්‍රතිපූර්ණයන්ට අදාල චෙක්පත් සෘජුව අලුත්වැඩියා කරනු ලබන ආයතනය නමින් නිකුත් කර තිබුණි.

(ඇ) 2014 ජනවාරි මාසයේ සිට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ අමාත්‍යාංශයේ කාර්මික නිලධාරියකුගේ 2014 අප්‍රේල්, මැයි හා ජූනි මාසවල වැටුප් වෙනුවෙන් අමාත්‍යාංශය විසින් ගෙවා තිබූ රු.141,312 ක් 2015 අගෝස්තු 11 දින වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 17 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 05 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 97 | 71 | 26 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 77 | 70 | 07 |
| | **එකතුව** | **205** | **163** | **42** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ පර්යේෂණ නිලධාරි තනතුරු සඳහා අනුමත සේවක සංඛ්‍යාව 02 ක් වුවද සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාව 03 ක් විය.

(ii) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 2 ඡේදයට පටහැනිව අමාත්‍ය කාර්ය මණ්ඩලයට අතිරේකව මාධ්‍ය අංශයේ නිලධාරීන් 04 දෙනෙකුගේ වැටුප් වෙනුවෙන් අමාත්‍යාංශ විසින් රු.1,204,480 ක් වැයකර තිබුණි.

(iii) ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අනුමත තනතුරු 10 ක් සඳහා බඳවාගැනීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | කාලපරිච්ඡේදය |
|---|---|---|
| ආරක්ෂක නියාමක | 01 | 2014.04.01 සිට 2015.01.13 |
| කාර්යාල කාර්ය සහයක | 01 | 2012.03.19 සිට 2015.01.13 |
| කළමනාකරණ සහකාර | 01 | 2012.11.06 සිට 2015.01.13 |
| රියදුරු | 01 | 2013.11.13 සිට 2014.08.14 |

(ඇ) කෘෂිකාර්මික හා ගොවිජන සේවා මණ්ඩලයේ රියදුරකු, 2010 ඔක්තෝබර් සිට 2015 ජූනි දක්වා ක්‍රීඩා අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඔහුගේ වැටුප් හා දීමනා වෙනුවෙන් පිළිවෙලින් රු.345,996 ක් හා රු.130,702 ක් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි.

## 4. ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

### 4.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ඊ) | ප්‍රසම්පාදන කමිටු පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (උ) | ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඊ) | ණය හා අත්තිකාරම් ලේඛනය | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

## 4.2 විගණන සාක්ෂි නොවීම

---------------------------

XL වන ජාතික මහ ක්‍රීඩා උළෙලට අදාලව නිලධාරින්ට සහ අනෙකුත් කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් සමිතියක් වෙත රු.588,672 ක් ගෙවා තිබුණද, ගෙවීම්වලට අදාල බිල්පත් සහ අදාළ නිලධාරින් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.3 විසර්ජන ගිණුම

-----------------

### අයවැය විචලනය

------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ගෙවීම් සඳහා අග්‍රිම සීමාවන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. අනුමත කළ සීමාවන් අනුව ඒ ඒ මාසවලදී අපේක්ෂා කළ පරිදි අග්‍රිම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුව වෙත නිකුත් කර නොතිබීම හා අවශ්‍යතා පැහැදිලිව හඳුනා නොගෙන ඇස්තමේන්තු සකස් කිරීම නිසා පහත සඳහන් වැය විෂයයන් 38 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදන සියයට 10 සිට 100 දක්වා උපයෝජනය කිරිමට නොහැකි වි තිබුණි.

## 4.4 අග්‍රිම ගිණුම

------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වුවද, ඊට පටහැනිව අවස්ථා 15 කදී

නිලධාරීන් 03 දෙනකුට රු.20,000 ක් ඉක්මවූ එකතුව රු.2,041,636 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ආ) අපේක්ෂිත වියදම් වෙනුවෙන් නිසි ඇස්තමේන්තු නොමැතිව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් නිලධාරින් විසින් අත්තිකාරම් ඉක්මවා වැයකර තිබූ රු. 274,417ක වියදම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 372 ප්‍රකාරව අග්‍රිම හා උප අග්‍රිම සෑම මාසයක් අවසානයේදීම සැසඳීම් කලයුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එසේ කර නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට මුදල්පොත අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු අග්‍රිම ශේෂය රු.20,687 ක් වුවත් විසර්ජන ගිණුමේ එය රු.108,672 ක් ලෙස සඳහන් කර තිබුණු අතර ශේෂයෙහි සංයුතියද දක්වා නොතිබුණි.

## 4.5 පොදු තැන්පත් ගිණුම්

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.167,373,462 ක්වූ අතර ඉන් වර්ෂ 2 ක් ඉක්මවූ රු.62,695,278 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසය වෙනුවෙන් පොදු ආකෘති 71 යටතේ පිළියෙල කරන ලද මාසික ගිණුම් සාරාංශයක් ඊලඟ මස අවසාන වීමට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරික මුද්‍රිත සටහන් අනුව පොදු තැන්පත් ගිණුම්වල ශේෂය රු.167,373,462 ක් ලෙස විසර්ජන ගිණුමේ දක්වා තිබුණු අතර කේවල ශේෂ ලැයිස්තුව අනුව ශේෂය රු.164,657,501 ක් විය. ඒ අනුව එම ශේෂ දෙක අතර රු.2,715,961 ක වෙනසක් විය.

## 4.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබද සැසඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විෂය අංක 21901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබද 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකල නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි එදිනට විශ්‍රාම ගිය හා සේවය හැරගිය නිලධාරින්ගේ අයවීම් හිඟහිටි ශේෂවල එකතුව

රු.360,663ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට සිට වර්ෂ 02 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) නැගෙනහිර පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ සිට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු ලැබ පැමිණි නිලධාරියකුගේ රු.128,152 ක ණය ශේෂය 2014 අගෝස්තු 29 දින නිරවුල් කර තිබුණද ඊට අදාල කිසිදු ණය වාරිකයක් නිලධාරියාගෙන් අයකරගෙන නොතිබුණි.

(ඇ) ස්ථාන මාරු ලැබ පැමිණි නිලධාරියකුගෙන් 2012 පෙබරවාරි මාසයේ සිට ණය වාරික අයකර තිබුණද, මාසිකව එය ප්‍රේෂණය නොකර රු.90,460 ක මුළු ණය මුදලම එකවර පළාත් සභාවට ගෙවා තිබුණි. තවද අදාල ණය ශේෂය සාමාජික ණය ලේඛනයටද ඇතුලත් කර තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ සේවය නියුතු නිළධාරින්ගේ කේවල ශේෂ ලැයිස්තු හා සේවක ණය ලේඛනයේ ශේෂයන් අතර රු.579,800 ක වෙනසක් විය.

## 4.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, මූලධන වියදම්වලට අදාල ව්‍යාපෘති පිළිබඳ විස්තර එම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

### 4.7.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කර නොතිබුණි.

### 4.7.3 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු. මිලියන 2,254.16 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර දෙපාර්තමේන්තුවට 324 ක කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 1,047.75 ක වත්කම් පැවතියද අභ්‍යන්තර විගණන

ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කර තිබුණත්, එය ප්‍රමාණවත් වී නොතිබුණි.

**4.8 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) **බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.491,689,055 ක් වී තිබුණත්, එය විසර්ජන ගිණුමෙහි දක්වා නොතිබුණි.

**4.9 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති හාරෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 880 | - | ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645(අ) | | වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 1646 | - | දෙපාර්තමේන්තුව සතු සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 1647 (ආ) | - | වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.2.11 ඡේදය | | දෙපාර්තමේන්තුවේ වාහන 21 ක් සම්බන්ධයෙන් මාස 6 කට වරක් ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛය | 9,643,850 | විදේශ ගමන් සඳහා යානාපත්‍ර මිලදී ගැනීම සෑමවිටම අනුමත සමාගම්වලින් සිදු කළ යුතු වුවද, ඊට පටහැනිව පුද්ගලික සමාගම්වලින් අදාල කටයුතු සිදු කර ගෙන තිබුණි. |
| (ii) | 2013 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2013 ජනවාරි 05 දිනැති අංක PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය | - | දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලීනව භාවිතයට ගෙන නොතිබූ වාහන 03 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 4.10 දේශීය මුලාකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාමීය ක්‍රීඩාපිටි වැඩි දියුණු කිරීමට අදාළ ඇස්තමේන්තු සකස් කිරීමේදී සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි අයවැය යෝජනා සකස් කර තිබුණද, ග්‍රාමීය ක්‍රීඩාපිටි වැඩි දියුණු කිරීමට අනුමත වී තිබූ රු.මිලියන 19.7 ක ප්‍රතිපාදනයම දිස්ත්‍රික්ක 3 ක් සඳහා පමණක් වැයකර තිබුණි. ඉතිරි දිස්ත්‍රික්ක 22 සඳහා එකී යෝජනා කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයට අදාලව ග්‍රාමීය ක්‍රීඩාපිටි වැඩි දියුණු කිරීම, දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, ග්‍රාමීය ක්‍රීඩකයින් සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම, පාසල් සංවර්ධන ව්‍යාපෘති හා පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම වෙනුවෙන් සළසා තිබූ රු. මිලියන 1,220 කින් සියයට 70 ක ප්‍රතිපාදන මහනුවර දිස්ත්‍රික්කයට වෙන්කර තිබීම ක්‍රීඩාව ජාතික වශයෙන් නගාසිටුවීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

(ඇ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කර්මාන්ත 45 ක් ඉටුකිරීම සඳහා දිස්ත්‍රික්ක 11 ක දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබා දී තිබූ රු.51,127,833 ක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වියදම් ලෙස සඳහන් කර තිබුණද, අදාල කර්මාන්ත, දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වී නොතිබුණු අතර කර්මාන්තවලට අදාළ කිසිඳු ලිපිගොනුවක්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද එකී කර්මාන්ත ඉටුකළ බවට දිස්ත්‍රික් ලේකම්වරුන් විසින්ද සනාථ කර නොතිබුණි.

(ඈ) 2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් 219-02-02-12-2104 වැය විෂයය යටතේ පාසල් 04 ක සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් රු.32,000,000 ක ප්‍රතිපාදන සළසා දී තිබුණත්, වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සළසා නොතිබුණු ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.17,018,303 ක් වැයකර තිබුණි.

(ඉ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද රු.මිලියන 3,208,282,018 ක කර්මාන්ත 57 ක් වර්ෂ 1 සිට වර්ෂ 3 ක කාල පරාසයක කාලයක් අවිච්ඡේදව පැවතුණි.

(ඊ) 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව 2014-2016 මැදි කාලීන වියදම් රාමුව තුළ රාජ්‍ය ආයෝජන සැලකිල්ලට ගෙන 2014 වර්ෂය සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ප්‍රමාණයන් පමණක් 2014 වර්ෂය සඳහා මූලධන වියදම් සඳහා ප්‍රතිපාදන සළසා දී තිබුණි. 2014 වර්ෂය සඳහා සළසා තිබුණු

ප්‍රතිපාදනවලින් පරිබාහිරව කිසිදු ගෙවීමක් නොකළ යුතු බවට අවධාරණය කර තිබියදීත් ඊට පටහැනිව 219-02-02-17-2104 දරන (පළාත් හා ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම) වැය විෂයය යටතේ වූ ප්‍රතිපාදනවලින් අමාත්‍යාංශ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් හා ජෙනරේටරයක් මිලදී ගැනීම වෙනුවෙන් රු.49,876,212 ක් වැය කර තිබුණි. තවද රු.9,963,876 ක් වැයකර මිලදී ගෙන තිබූ ජෙනරේටරය ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

## 4.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2014 වර්ෂයේ පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට සහභාගී වූ ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමයේ ක්‍රීඩකයකුගේ ගුවන් ගමන් ටිකට්පත් ගාස්තු වෙනුවෙන් රු.234,666 ක්, 2010 ජූලි මාසයේ ගුවන් ගමන් ටිකට්පතක් පදනම් කරගෙන දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් කර තිබුණි.

## 4.12 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) XL වන ජාතික මහ ක්‍රීඩා උළෙලේ කාර්යය මණ්ඩලයට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් ආයතන 17 ක් වෙත රු.2,589,494 ක් ගෙවා තිබූ අතර ක්‍රීඩා උළෙලට සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩා නිලධාරීන්ට බෙදා දීම සඳහා ගමන් මලු 3500 සහ ටී ෂර්ට්ස් 3500 ක් රු.4,970,380 ක් වැයකර මිලදී ගෙන තිබුණද අදාල සැපයුම්කරුවන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 මාර්ගෝපදේශය ප්‍රකාරව මිල කැඳවීම් කර තෝරාගෙන නොතිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ 6/2006 වැටුප් චක්‍රලේඛයේ විධිවිධාන වලින් බැහැර රාජකාරී සඳහා වූ නියමයන්ට පටහැනිව හා භාණ්ඩාගාර විශේෂ අනුමැතියකින් තොරව ජාතික මහ ක්‍රීඩා උළෙලට අදාලව නිලධාරින්ගේ නවාතැන් පහසුකම් සහ ආහාර පාන වෙනුවෙන් වූ වියදම් අරපිරිමැසුම් රහිත කර තිබුණි.

(iii) 2014 පෙබරවාරි 12 දින ක්‍රීඩා සමාජයක් විසින් කරන ලද ඉල්ලීමකට අනුව වොලිබෝල් 15 ක් මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණද තරගකාරී මිල කැඳවීමකින් තොරව රු.140,250 ක් වැයකර වොලිබෝල් 20 ක් පුද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5, 2.8.1 හා 4.2 මාර්ගෝපදේශයන් ප්‍රකාරව පිළිවෙලින් ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකර හා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකර, නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ (ක්‍රීඩා) හා වොලිබෝල් පුහුණුකරුවෙකුගේ නිර්දේශ මත දෙපාර්තමේන්තුව විසින් රු.13,812,500 ක් වැයකර ක්‍රීඩා භාණ්ඩ මිලදීගෙන තිබුණි.

**(ආ) අනුමත නොකළ ගෙවීම්**

XL වන ජාතික මහ ක්‍රීඩා උළෙලට අදාල ගෙවීම් වවුචර් 24 කින් කරන ලද රු.7,873,104 ක ගෙවීම් සඳහා අනුමැතිය ලබාදීමකින් තොරව ගෙවීම් වවුචරය මත වියදම් දැරීමට පෙර'' අනුමත කරමි'' යන මුද්‍රාව තුළ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් තබා තිබූ අත්සන් පදනම්කරගෙන ගෙවීම් කර තිබුණි.

**4.13 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

2015 ජුලි 31 දින වනවිට බැංකු ගිණුම් 01කට අදාල බැංකු සැසඳුම් 2014 අගෝස්තු මාසයේ සිට 2015 ජූනි මාසය දක්වා පිළියෙල කර නොතිබුණි.

**4.14 පාඩු හා හානි**

ශ්‍රී ලංකා කරාතේදෝ සංගමය විසින් ලෝක කරාතේදෝ සංගමයේ 2013 හා 2014 වර්ෂවල සාමාජිකත්ව හා ජාතික රයිෆල් සංගමය විසින් International Practical Shooting Confederation හි 2012 හා 2013 වර්ෂයවල සාමාජිකත්ව නියමිත දිනට ලබා නොගැනීම නිසා අධිභාර ලෙස පිළිවෙලින් රු.111,336 ක් හා රු. 27,406 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

**4.15 කළමනාකරණ දුර්වලතා**

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩා සංගම් වෙත රු.79,988,392 ක් ලබාදී තිබුණද, වියදම් රජයේ නීති, රීති හාරෙගුලාසිවලට අනුකූලව වැය කළ බවට හා අරමුදල් උපයෝජනයේ ඵලදායීත්වය සම්බන්ධයෙන් ප්‍රගතිය තහවුරු කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කිරීමක් කර නොතිබුණි.

**4.16 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.**

2014 දෙසැම්බර් 31 දිනට වූ අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා පහත පරිදි වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 95 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 05 | 10 | - |
| (ii) තෘතියික මට්ටම | 03 | 01 | 02 | - |
| (iii) ද්විතියික මට්ටම | 254 | 185 | 69 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 52 | 49 | 03 | - |
| (v) කොන්ත්‍රාත් පදනම | - | 03 | - | 03 |
| **එකතුව** | **324** | **243** | **84** | **03** |

**5 ක්‍රීඩා සංගම්**

**5.1 ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය**

**5.1.1 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන**

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළුතර ක්‍රීඩාංගනය නැවත සංවර්ධනය කිරීම වෙනුවෙන් ඉතාලි පාපන්දු ක්‍රීඩකයන්ගේ සංගමයෙන් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ලබාදී තිබූ රු.6,287,670 කට සමාන යූරෝ 40,400 ක පරිත්‍යාගයක්, සම්මේලනයේ කළමනාකරණ කමිටුවේ හිටපු සභාපති විසින් වංචාසහගතව ලබාගෙන තිබුණි.

(ආ) පාපන්දු සම්මේලන සභාපති කුසලාන තරඟාවලියේ මූලික වටයේ සුදුසුකම් ලැබීමේ තරඟාවලි පැවැත්වීම වෙනුවෙන් ආසියානු පාපන්දු සම්මේලනයෙන් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ලබාදී තිබූ රු. 6,415,290 කට සමාන ඇ.ඩොලර් 60,000 ක සත්කාරක ආධාර මුදලක් සම්මේලනයේ හිටපු කළමණාකරන කමිටුවේ සභාපතිවරයා විසින් වංචාසහගතව ලබාගෙන තිබුණි.

(ඇ) සුනාමි ව්‍යාවසනයෙන් හානියට පත්වූ කළුතර ප්‍රදේශයේ නිවාස 20 ක් ඉදිකිරීම සඳහා සීමා සහිත පුද්ගලික සමාගමකින් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ලබාදී තිබූ රු.10,000,000 ක මුදල් පරිත්‍යාගයෙන් රු.5,000,000 ක් සම්මේලනයේ හිටපු කළමණාකරන කමිටුවේ සභාපතිවරයා විසින් වංචාසහගතව ලබාගෙන තිබුණි.

(ඈ) ආසියානු පාපන්දු සම්මේලනය විසින් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ලබාදී තිබූ ඇ.ඩොලර් 200,000 කින් ඇ.ඩොලර් 40,000 ක් හිටපු කළමණාකරන කමිටුවේ සභාපතිවරයා විසින් වංචා සහගත ලෙස ලබාගෙන තිබුණි. තවද හිටපු ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් 2008 ජූනි 06 දින සම්මේලනයේ බැංකු ගිණුමෙන් ඉවත් කරගෙන තිබූ රු.3,217,500 කට සමාන ඇ.ඩොලර් 30,000 ක මුදලින් රු.1,337,035 කට සමාන ඇ.ඩොලර් 12,533 ක් 2015 ජනවාරි 19 දින වන විටත් සම්මේලනයට බාරදී නොතිබුණි.

(ඉ) තවද විධායක කමිටු අනුමැතියකින් තොරව හා සම්මේලනයේ බැංකු ගිණුම්හි ප්‍රමාණවත් අරමුදල් තිබියදී, සම්මේලනයේ හිටපු ප්‍රධාන විධායක නිලධාරිවරයා 2008 ජූනි 20 දින, හිටපු කළමණාකරන කමිටු සභාපතිවරයාගෙන් රු.6,000,000 ණය මුදලක් ලබාගෙන තිබුණු අතර අදාල ණය පියවීම සඳහා ඇ.ඩොලර් 60,000 ක් සම්මේලනයේ බැංකු ගිණුමෙන් හිටපු කළමණාකරන කමිටු සභාපතිවරයාගේ පුද්ගලික ගිණුමට ව්‍යාජ බැංකු නියෝගයක් මගින් මාරු කර තිබුණි.

(ඊ) තායිලන්ත පාපන්දු සම්මේලනය විසින් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට පරිත්‍යාග ලෙස ලබාදී තිබූ පාපන්දු 5,717ක් අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(උ) ලෙජර් ගිණුමට අනුව නොපියවූ අත්තිකාරම් ශේෂය රු.1,523,312 ක් වූ අතර උප ලේඛනයට අනුව එය රු. 3,349,250 ක් විය. ඒ අනුව වෙනසට හේතු සොයාබලා එය නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඌ) 2012 දෙසැම්බර් 31 දිනට එකතු රු.224,141,484 ක්වූ ගනුදෙනු 25 කට අදාල ගෙවීම් වවුචර්, තොග ලේඛන, භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් පත්, බිල්පත්, ලදුපත්, ජර්නල් වවුචර් හා තහවුරු ලියකියවිලි, විධායක කමිටු අනුමැති, ශේෂ සනාථ කිරීම්, ස්ථාවර

තැන්පතු සහතික, වියදම් විස්තර හා ක්‍රොන්ත්‍රාත් ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකළ එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(එ) කල්බදු වත්කම්වල වටිනාකම්, කල්බදු ගිවිසුම්වල සඳහන් කර නොතිබුණි. ඒ හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රයේ සඳහන් කර තිබුණු රු.161,243,752 ක් වූ කල්බදු වත්කම්වල පොත් අගය හා සමාලෝචිත වර්ෂයේදී ලියාහරින ලද රු.7,208,008 ක කල්බදු වත්කම්වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනිමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) සම්මේලනය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ස්ථාවර වත්කම්වල හිමිකාරත්වය, පැවැත්ම හා අගය තහවුරු කර ගැනීමට අදාළ තහවුරු කිරීමේ ලියකියවිලි වර්ෂ ගණනාවක් මුළුල්ලේ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කර එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුන් නිසා සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණු රු.98,080,678 ක් වූ ස්ථාවර වත්කම් සතුටුදායක ලෙස වත්කම් සත්‍යාපනය කර ගැනිමට විගණනයේදී නොහැකි විය.

(ඔ) විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| * මුදල් රෙගුලාසි 446(3) | සුළු මුදල් පොත යාවත්කාලින කර නොතිබුණි. |
| * මුදල් රෙගුලාසි 751 | තොග ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. |
| * මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**(ii) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | |
|---|---|
| 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛය | විදේශ ගමන් සඳහා යානා පත්‍ර අනුමත සමාගම්වලින් මිලදී නොගෙන වෙනත් පෞද්ගලික සමාගම්වලින් එකතුව රු.3,830,300 ක් වටිනා යාන පත්‍ර සම්මේලනය විසින් මිලදි ගෙන තිබුණි. |

**(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | |
|---|---|
| 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛය. | සම්මේලනයේ නිලධාරියකු විශ්‍රාමයාමේදී සම්මේලනයට අයත් මෝටර් රථයක් ඔහු විසින් රැගෙන ගොස් තිබුණි. |

(ඕ) සේවක සංඛ්‍යාව අනුමත කර ගැනිම, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය පිළියෙල කර අනුමත කර ගෙන නොතිබිම, සංවිධාන සටහන පිළියෙල කර අනුමත කර ගෙන නොතිබීම හා පෞද්ගලික ලිපිගොනු යාවත්කාලින කර නොතිබිම හේතුවෙන් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් ආයතනයේ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණයක් 2014 වර්ෂය අවසාන වන විටත් ස්ථාපිත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ක) සම්මේලනය විසින් රු.9,084,332 ක මාසික සාමාන්‍ය මුදල් ශේෂයය ඵලදායීව ආයෝජනය කිරීමෙන් තොරව ජංගම ගිණුම් හතරක රදවාගෙන තිබුණි.

(ග) 2014 වර්ෂය අවසාන වන විටද සම්මේලනයේ කළමනාකරණය විසින් තොග පාලනය සම්බන්ධයෙන් සුදුසු පාලන ක්‍රමයන් ස්ථාපිත කර නොතිබුණු අතර විවිධ සංවිධාන විසින් පරිත්‍යාග ලෙස ලබා දී තිබූ ක්‍රිඩා අයිතම හා ද්‍රව්‍යවලට අදාළව කිසිම තොග ලේඛනයක්ද පවත්වා නොතිබුණි. තවද මිලදී ගැනීම්වලට අදාලව සුදුසු පාලන ක්‍රමයන් සම්මේලනයවිසින් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් බෝහෝ අවස්ථාවලදී, පුද්ගලයින් විසින් සෘජුව භාණ්ඩ හා සේවා මිලදී ගෙන ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කර තිබුණි.

(ච) සේවක ණය සම්බන්ධයෙන් පවත්නා දුර්වල අභ්‍යන්තර පාලනය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.485,000 ක සේවක ණය බොල්ණය ලෙස කපාහැරීමට සිදු වී තිබුණි.

(ජ) අනුමත සේවක සුභසාධන යෝජනා ක්‍රමයක් නොමැතිව සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂයේදී නිලධාරියකුගේ රෝහල් ගාස්තු පියවීම වෙනුවෙන් රු.1,591,439 ක් වැයකර තිබුණි.

(ඣ) තරගකාරී මිල කැඳවීමකින් හා විධායක කමිටු අනුමැතියකින් තොරව, සම්මේලනය විසින් ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව 2003 වර්ෂයේදී පෞද්ගලික පාර්ශවයකට රු.40,000 ක මාසික කුලියකට වර්ෂයක් සඳහා බදු දී තිබුණි. එම ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුව ලිඛිත ගිවිසුමකින් හා මාසික කුලිය සංශෝධනය කිරීමෙන් තොරව, 2012 වර්ෂය අවසානය වන විටත් ආපනශාලාව පවත්වාගෙන යාමට එම ක්‍රොන්ත්‍රාත්කරුට ඉඩදී තිබුණි. තවද ක්‍රොන්ත්‍රාත්කරු විසින් මාස 2 ක සිට මාස 3 ක් දක්වා කාලයක් ප්‍රමාද කර මාසික කුලී ගෙවා තිබුණි.

(ත) තරගකාරී මිල කැඳවීමකින් හා විධායක කමිටු අනුමැතියකින් තොරව, සම්මේලනය විසින් කණ්ඩාම් ක්‍රීඩකයින් හා අනෙකුත් අයට ආහාර පාන සැපයීමේ කොන්ත්‍රාත්තුව ලිඛිත ගිවිසුමකින් තොරව පෞද්ගලික පාර්ශ්වයකට ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ආහාර පාන සැපයීම වෙනුවෙන් එම කොන්ත්‍රාත්කරුට රු.7,008,390 ක් ගෙවා තිබුණි.

(ද) සම්මේලනය විසින් නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමේදී සුදුසු පරිපාටියක් අනුමත කර නොතිබුණි. ඒ හේතුවෙන් 2012 ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා කාලය තුළ නිලධාරීන් හයදෙනකුට ඔවුන්ගේ පෙර අත්තිකාරම් නොපියවා තිබියදී එකතුව රු.3,825,920 ක් වූ අත්තිකාරම් ලබා දී තිබුණි.

(ධ) අවස්ථා අටකදී නිලධාරීන් හට ලබා දී තිබූ රු.1,523,312 ක අත්තිකාරම් 2013 මැයි 08 දින දක්වා පියවා නොතිබුණි. තවද එකතුව රු. 2,315,000 ක අත්තිකාරම් දින 11 සිට දින 47 ක ප්‍රමාදයන් සහිතව පියවා තිබුණි.

(න) සම්මේලනය විසින් 2014 වර්ෂය අවසාන වන විටද සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ලගාකර ගතයුතු අරමුණු හා ඉලක්කයන් හදුනාගනිමින් කළමනාකරුවන්ගේ වගකීම් දක්වමින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ප) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් 2014 වර්ෂය අවසාන වන විටත් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

(බ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සම්මේලනය විසින් 2012 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී සම්මේලනය විසින් ක්‍රීඩා උපකරණ හා ප්‍රවාහන පහසුකම් ලබාගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.1,713,150 ක් හා රු.1,689,783 ක් වැයකර තිබුණි.

### 5.1.2 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

-----------------------------------------------------------------

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.66,512,630 ක්වූ ගනුදෙනු 09 කට අදාල ගෙවීම් වවුචර්, භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් පත්‍ර, බිල්පත්, ලදුපත්, ජර්නල් වවුචර් හා තහවුරු ලියකියවිලි, විධායක කමිටු අනුමැතිය, ශේෂ සනාථ කිරීම් හා ස්ථාවර තැන්පතු සහතික විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ආ) කල්බදු ගිවිසුම්වල කල්බදු වත්කම්වලට අදාල වටිනාකම් සඳහන් කර නොතිබීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රයේ සඳහන් කර තිබුණු රු.156,110,770 ක් වූ කල්බදු වත්කම්වල පොත් අගය හා සමාලෝචිත වර්ෂයේදී ලියාහරින ලද රු.5,132,982 ක කල්බදු වත්කම්වල වටිනාකමේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) සම්මේලනය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ස්ථාවර වත්කම්වල හිමිකාරත්වය, පැවැත්ම සහ අගය තහවුරු කර ගැනීමට අදාල තහවුරු ලියකියවිලි ලෙස වර්ෂ ගණනාවක භාණ්ඩ සමීක්ෂණ වාර්තාද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණු රු.95,824,740 ක් වූ ස්ථාවර වත්කම්වල පොත් අගය විගණනයේදී තහවුරු කර ගැනිමට නොහැකි විය.

**(ඈ)** නියැදි විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේමුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| * මුදල් රෙගුලාසි 446(3) | සුළු මුදල් පොත යාවත්කාලින කර නොතිබුණි. |
| * මුදල් රෙගුලාසි 751 | තොග ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. |
| * මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ii) 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | සම්මේලනය විසින් රු. 14,709,704 ක යානා පත්‍ර අනුමත සමාගම්වලින් මිලදී නොගෙන පෞද්ගලික සමාගම්වලින් මිලදී ගෙන තිබුණි. |

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සම්මේලනයේ සේවකයින් 39 දෙනකුගේ වැටුප් හා දීමනා වෙනුවෙන් එකතුව රු.12,741,120 ක් වැයකර තිබුණි. පූර්ව අනුමැතියකින් තොරව වෙනත් දීමනාද ගෙවා තිබුණු අතර අනුමැතියකින් හා පත්වීම් ලිපි නොමැතිව සේවකයින් 27 දෙනකුට රු.810,000 ක වැටුප් වර්ධකද ලබාදී තිබුණි.

(ඊ) නිසි අනුමැතියකින් හා කොන්ත්‍රාත් ගිවිසුම්වලින් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරීන් 37 දෙනකුගේ දීමනා වෙනුවෙන් රු.8,548,080 ක් වැය කර තිබුණු අතර ඔවුන්ට අනුමැතියකින් තොරව වැටුප් වර්ධකද ලබා දී තිබුණි.

(උ) තරගකාරී මිල කැඳවීමකින් හා විධායක කමිටු අනුමැතියකින් තොරව සම්මේලනය විසින් බැද්දගාන ශරීර සුවතා මධ්‍යස්ථානය පෞද්ගලික පාර්ශවයකට රු.65,000 ක මාසික කුලියකට ලිඛිත ගිවිසුමකින් තොරව බදු දී තිබුණි.

(ඌ) තරගකාරී මිල කැඳවීමකින් හා විධායක කමිටු අනුමැතියකින් තොරව, සම්මේලනය විසින් කණ්ඩායම් ක්‍රීඩකයින් හා අනිකුත් අයට ආහාරපාන සැපයීමේ කොන්ත්‍රාත්තුව ලිඛිත ගිවිසුමකින් තොරව පෞද්ගලික පාර්ශවයකට ලබා දී තිබුණි. තවද ආහාර පාන සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 6,498,615 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(එ) විගණකාධිපතිගේ එකගත්වයකින් තොරව සමාලෝචිත වර්ෂයේදී සම්මේලනය විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය පුද්ගලික විගණන සමාගමකට ලබා දී තිබූ අතර ඒ වෙනුවෙන් රු. 300,000 ක් විගණන ගාස්තු ගෙවා තිබුණි.

(ඒ) සියලු ගෙවීමක් සඳහා අධිකාරය, අනුමැතිය හා සහතික කිරිම තිබිය යුතු වුවත්, 2013 හා 2014 වර්ෂවලදී නිසි අධිකාරයකින්, අනුමැතියකින් හා සහතික කිරීමකින් තොරව සමහර ගෙවීම් සිදු කර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී ලගාකර ගතයුතු අරමුණු හා ඉලක්කයන් හදුනාගනිමින් කළමනාකරුවන්ගේ වගකීම් දක්වමින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ඕ) ඵලදායී මූල්‍ය පාලනයක් ඇතිකර ගැනීම සඳහා සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයට පෙර අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා සම්මේලනය විසින් අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

(ක) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සම්මේලනය විසින් 2013 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ග) යාපනයේ තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සම්මේලනය වෙත ජර්මන් තානාපති කාර්යාලයෙන් රු.8,264,500 ක පරිත්‍යාගයක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එයින් රු.8,100,000 ක අත්තිකාරම් මුදලක් ක්‍රොන්ත්‍රාත්කරුවකුට විධායක කමිටු අනුමැතියකින් තොරව ලබා දී තිබුණි. තවද අනුමත සැලැස්ම, ඇස්තමේන්තුව සහ කොන්ත්‍රාත් ගිවිසුමද විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි..

(ච) රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංගහයේ විධිවිධානවලට පටහැනිව සහ විධායක කමිටුවේ අනුමැතියකින් තොරව ගම්පහ ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව, ක්‍රොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්මේලනය විසින් ඒ සඳහා රු.9,500,000 ක් ගෙවා තිබුණි. එම ඉදිකිරිමට අදාළ අනුමත

සැලැස්ම, ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත් ගිවිසුම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 5.1.3 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා හතරකදී ලැබී තිබූ රු.1,958,080 ක ක්‍රීඩා අයිතම හා අනිකුත් ද්‍රව්‍ය ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ගිණුම් අනුවකට අදාල ශේෂයන් හා ලෙජර් ගිණුම් ශේෂයන් අතර රු.69,331,951 ක වෙනසක් පැවැති අතර එම ශේෂ සසඳා නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන රු.1,795,500 ක වෙනත් ලැබිය යුතු ශේෂයන් හා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.5.245,000 ක ශේෂයන්ට අදාල විස්තරාත්මක උපලේඛන, තහවුරු කිරීමේ ලියකියවිලි හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි..

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.144,225,557 ක්වූ ගනුදෙනු 09 කට අදාල ගෙවීම් වවුචර්, භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් පත්‍ර, බිල්පත්, ලදුපත්, ජර්නල් වවුචර් හා තහවුරු ලියකියවිලි, විධායක කමිටු අනුමැති, ශේෂ සනාථ හා ස්ථාවර තැන්පතු සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

(ඉ) කල්බදු වත්කම්වල වටිනාකම් කල්බදු ගිවිසුම්වල සඳහන් කර නොතිබීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රයේ පෙන්නුම් කරන රු.151,284,553 ක්වූ කල්බදු වත්කම්වල පොත් අගය හා සමාලෝචිත වර්ෂයේදී ලියාහරින ලද රු.5,132,982 ක වටිනාකමේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනිමට නොහැකි විය.

(ඊ) සම්මේලනය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම හා මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ස්ථාවර වත්කම්වල හිමිකාරත්වය, පැවැත්ම සහ අගය තහවුරු කර ගැනීමට අදාල තහවුරු කිරීමේ ලියකියවිලි හා වර්ෂ ගණනාවක භෞතික සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් නොවීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා වන

මුල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන රු.109,097,678 ක් වූ ස්ථාවර වත්කම්වල පොත් අගය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(උ) මුල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණු රු.162,868,675 ක් වූ විලම්බිත ආදායම් හා වර්ෂයේදී ලියාහැර තිබූ රු.8,291,439 ක විලම්බිත ආදායම්වලට අදාල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) සම්මේලනයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | | **අනුකූල නොවීම** |
|---|---|---|
| **(i)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | * මුදල් රෙගුලාසි 751 | තොග ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| | * මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ii)** | **2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.7,846,101 ක් වටිනා යාන පත්‍ර අනුමත සමාගම්වලින් මිලදී නොගෙන වෙනත් පෞද්ගලික සමාගම්වලින් මිලදී ගෙන තිබුණි. |

(එ) තරගකාරී මිල කැදවීමකින් හා ලිඛිත ගිවිසුමකින් තොරව සම්මේලනය විසින් ප්‍රධාන කාර්යාලයේ දෙවන හා තෙවන මහල් පිළිවෙලින් රු.100,000 හා රු.150,000 ක මාසික කුලියකට සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික පාර්ශ්වයකට බදු දී තිබුණි.

(ඒ) තරගකාරී මිල කැදවීමකින් හා විධායක කමිටු අනුමැතියකින් තොරව, සම්මේලනය විසින් කණ්ඩාම් ක්‍රීඩකයින් හා අනිකුත් අයට ආහාරපාන සැපයීමේ කොන්ත්‍රාත්තුව ලිඛිත

ගිවිසුමකින් තොරව පෞද්ගලික පාර්ශවයකට ලබා දී තිබුණු අතර ආහාර පාන සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.13,887,701 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඔ) නීතිපතිගේ සේවය ලබා ගැනීමට අවස්ථාව තිබියදී සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂයේදී පුද්ගලික නීති ගාස්තු වෙනුවෙන් රු.6,456,237 ක් වැයකර තිබුණි.

(ඕ) විවිධ ආයතන විසින් කරන ලද ඉල්ලීම් මත සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.4,708,984 ක පාපන්දු පරිත්‍යාග කර තිබුණද, අනුමත උපලේඛන හා බෙදාහැරීමට අදාල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේදී ලගාකර ගතයුතු අරමුණු හා ඉලක්කයන් හදුනාගනිමින් කළමනාකරුවන්ගේ වගකීම් දක්වමින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ග) ඵලදායී මූල්‍ය පාලනයක් ඇතිකර ගැනීම සඳහා සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයට පෙර අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද, සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

(ච) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සම්මේලනය විසින් 2014 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ජ) සම්මේලනය විසින් කිසිදු සේවාවක් ලබා නොගෙන, අවස්ථා 20 කදී මාධ්‍යවේදීන් විසින් කරන ලද පෞද්ගලික ඉල්ලීම් මත සම්මේලනය විසින් රු.480,000 ක් ගෙවා තිබුණි.

## 5.2 ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනය

### 5.2.1 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනයේ 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 1,264,957 ක්වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සම්මේලනය විසින් ආරම්භයේ සිටම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) විදේශීය රටවල් විසින් පරිත්‍යාග ලෙස ලබාදී තිබූ ක්‍රීඩා උපකරණ නිෂ්කාශනය සඳහා සම්මේලනය විසින් රු..3,080,298 ක රේගු ගාස්තු ගෙවා තිබුණි.කෙසේ වුවද අදාල උපකරණ අගය කර ගිණුම් වලට ගැනීමට සම්මේලනය අපොහොසත් වී තිබුණි..

(ඇ) 2012දෙසැම්බර් 31 දිනට එකතුව රු.5,150,337 ක්වූ ගනුදෙනු 08 කට අදාල භෞතික සමීක්ෂණ වාර්තා, විධායක කමිටු අනුමැති, ඇස්තමේන්තු හා භාණ්ඩ ලැබීම් හා බෙදාහැරීම් විස්තර විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**(ඈ)** සම්මේලනයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (i) 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ඡේදය | විදේශ ගමන් සඳහා යානා පත්‍ර මිලදී ගැනීම හා මිලදී ගැනීම් කටයුතු සෑම විටම අනුමත සමාගම් මගින් කරවා ගතයුතු වුවද ඊට පටහැනිව ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනය විසින් රු.4,856,359 ක යානා පත්‍ර පෞද්ගලික සමාගම්වලින් ලබාගෙන තිබුණි. |
| (ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | |
| - 3.4 මාර්ගෝපදේශය | තරගකාරී මිල කැඳවීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී සම්මේලනය විසින් රු. 2,721,332 ක් වටිනා ක්‍රීඩා උපකරණ හා වෙනත් අයිතම මිලදී ගෙන තිබුණි. |
| - 3.4 මාර්ගෝපදේශය | තරගකාරී මිල කැඳවීමෙන් තොරව සම්මේලනය විසින් මීගමුව වෙරළ අත්පන්දු තරගාවලියේ කුටි සැකසීම සඳහා බාහිර පාර්ශවයක් තෝරාගෙන තිබුණි. කුටි සැකසීමේ හා පරිපාලන ඇස්තමේන්තුගත පිරිවැය රු.2,160,500 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණු අත්තිකාරම් මුදල රු. 500,000ක් විය. |

**5.2.1 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන**

ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනයේ 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට රු.2,573,500 ක් වූ වසර 2ට වඩා පැරණි උපචිත ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනයෙන් අයවිය යුතු රු.2,344,757 ක ශේෂය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගිණුම් වාර්තා අනුව ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනයට ගෙවිය යුතු රු. 1,048,707 ක ශේෂය ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට එකතු රු.30,776,078 ක්වූ ගනුදෙනු 14 කට අදාල ජ'නල් වවුචර් හා තහවුරු කිරීමේ ලියකියවිලි, බිල්පත්, භාණ්ඩ බෙදාහැරීමේ විස්තර, වියදම් විස්තර හා ද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම්වලට අදාළ තොග වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් එම ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

(ඈ) සම්මේලනයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.** | |
| * මුදල් රෙගුලාසි 385 | ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනය විසින් Brass awards 123 ක් මිලදී ගැනීම වෙනුවෙන් පුද්ගලික ආයතනයකට චෙක්පත් මගින් ගෙවීම් නොකර රු.300,000 ක් මුදලින් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| * | මුදල් රෙගුලාසි 395(ඇ) | සෑම මසකම බැංකු සැසඳුම් ප්‍රකාශ ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කර සහතික කළ යුතු වුවද, සම්මේලනය විසින් 2013 වර්ෂයට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| | මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය** | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශවලට පටහැනිව අවස්ථා හතරකදී භාණ්ඩ නිෂ්කාශණ සේවා ලබාගැනීම, කුසලාන මිලදී ගැනීම, අත්පන්දු සහ පරිගණක මිලදී ගැනීම සඳහා රු.1,183,612 ක් වැය කර තිබුණි. |

(ඉ) ජනාධිපති රන් කුසලාන තරඟාවලිය සඳහා එකතුව රු.4,828,625 ක් වැය කර තිබුණි. මේ සඳහා ප්‍රධාන අනුග්‍රාහක ලෙස පෞද්ගලික ආයතනයක් තෝරා ගෙන තිබුණු අතර ඒ සඳහා විධායක කමිටුවේ අනුමැතිය හා ආයතනය සමඟ ඇති කරගත් ගිවිසුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනය සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් නොතිබු අතර බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර අනුමත කරවා ගෙන නොතිබුණු අතර සේවකයින් වෙනුවෙන් පෞද්ගලික ලිපිගොනුද යාවත්කාලින කර නොතිබුණි.

(උ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව, සම්මේලනය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඌ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(එ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සම්මේලනය විසින් 2013 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 5.3 ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

-----------------------------------------------------------------------------------------------

### 5.3.1 මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------------------------------

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල 17.19 ඡේදය අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වල ප්‍රයෝජනවත් කාලය නැවත ඇගයීම් කර ඒ අනුව ක්ෂය ගිණුම් ගත කළ යුතු වුවද, භාවිතයට ගන්නා වූ පිරිවැය රු.552,660,460 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් සම්බන්ධයෙන් එසේ ක්‍රියා කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපොහොසත් වී තිබුණි. තවද 2014 දෙසැම්බර් 31 දිනට වූ රු.5,554,250,826 ක්වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

### 5.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් අයාතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පිළිවෙලින් රු.2,187,280,006 ක් හා රු.567,601,808 ක් ගෙවිය යුතුව තිබුණි. කෙසේ වුවද , ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.71,934,708 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ගෙවිය යුතුව තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.1,133,826,034 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙතින් ලැබිය යුතුව පවතින බව දක්වා තිබුණි.

(ආ) වර්ෂ පහකට වඩා වැඩි රු.7,455,135 ක් වූ ලැබිය යුතු අනුග්‍රාහක ආදායම් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඇ) එකතුව රු.19,345,013 ක් වූ ඉදිකිරීම් අත්තිකාරම් සහ එකතුව රු.13,714,688 ක් වූ වෙනත් අත්තිකාරම් වර්ෂයකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද පියවා නොතිබුණි.

(ඈ) තරගාවලි අත්තිකාරම් වශයෙන් රු.15,427,071 ක් වූ වර්ෂයකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද, එම අත්තිකාරම් පියවා නොතිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.8,011,802 ක්වූ ගනුදෙනු 05 කට අදාල භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් පත්‍ර හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් එම ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**5.3.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ඡේදය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් එකතුව රු.25,252,115 ක් වටිනා යානා පත්‍ර පෞද්ගලික සමාගම්වලින් මිලදී ගෙන තිබුණි. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් රු.4,860,003 ක වත්කම් හා රු.7,862,153 ක නීති සේවාවන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව ලබා ගෙන තිබුණි. |

**5.3.4 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනය හා ‍ රේඛිය අමාත්‍යාංශ අතර කටයුතු සම්බන්ධීකරණය සඳහා විධායක කමිටුවේ අනුමැතිය මත අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරක් සඳහා අයදුම්පත් කැඳවීමෙන් තොරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් නිලධාරියකුට පත්වීමක් ලබාදී තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනය හා ක්‍රීඩා අමාත්‍යාංශ විසින් අදාල නිලධාරියාගේ වැටුප් හා දීමනා වෙනුවෙන් පිළිවෙලින් රු.900,000 ක් හා රු.301,663 ක් වාර්ෂිකව වැයකර තිබුණි. අදාල නිලධාරියා විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනයේ පැමිණීමේ ලේඛනයේ පැමිණීමද සටහන් කර නොතිබුණි.

(ආ) රේඛිය අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියකින් තොරව, ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනයේ විධායක කමිටුව විසින් සේවකයකුට

2013 අප්‍රේල් 01 දින සිට 2016 මාර්තු 31 දින දක්වා වරුවක් රාජකාරී කර කාර්යාලයෙන් පිටවීමට අවසරදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් අදාල නිලධාරියාගේ වැටුප් වෙනුවෙන් රු. 605,200ක් වැයකර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනයේ දුර්වල මූල්‍ය තත්ත්වය සැලකිල්ලට නොගෙන කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින්ට අනුමත පරිපාටියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.5,000 ක සිට රු.86,250 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් වැටුප් වර්ධක ලබා දී තිබුණු අතර දගපන්දු පුහුණුකරුවකුට 2013 වර්ෂයේදී රු.215,400 ක වැටුප් වර්ධකයක් ලබාදී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී එක් දින තරග 13 ක් හා ජාත්‍යන්තර ටෙස්ට් තරග 04 ක් වෙනුවෙන් විධායක කමිටු අනුමැතියකින් තොරව රු.45,094,300 ක් වටිනා ටිකට්පත් 46,742 ක් නොමිලේ නිකුත් කර තිබුණි. එසේ නොමිලේ නිකුත් කර තිබූ ටිකට්පත් ලබා ගත් පාර්ශ්වයන්ගෙන් සියයට 85 ක් පමණ ප්‍රමාණයක් ඒවා ලබාගත් බව තහවුරු කර නොතිබුණි.

### 5.3.5 ලාභදායීත්වය හා ද්‍රවශීලතාවය

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පසුගිය වර්ෂ කිහිපය තුළදී විශාල මෙහෙයුම් අලාභයන් හා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 392.7 ක ශුද්ධ මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවැති රු.මිලියන 4,303.5 ක වගකීම් පියවාගැනීමට ආයතනය සතුව ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් නොතිබීම හේතුවෙන් එය අයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

### 5.3.6 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනයේ අහිතකර මූල්‍ය තත්ත්වය සැලකිල්ලට නොගෙන, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2013 වර්ෂයේදී වැටුප් වර්ධක වෙනුවෙන් රු. මිලියන 26.7 ක් හා අයවැය ප්‍රතිපාදන නොමැතිව හදිසි අවශ්‍යතාවක් ලෙස සළකා වාහන 11 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 57.6 ක් වැයකර තිබුණි. තවද අදාල වාහන වෙන්කිරීම සම්බන්ධයෙන් විස්තර ස්ථාවර වත්කම් ලේඛනයේ හෝ වාහන ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ජාතික කණ්ඩායම් අනුග්‍රාහකත්වය සඳහා සමාගමක් සමග අත්සන් කර තිබූ ගිවිසුමේ 7.2 ඡේදය අනුව අනුග්‍රාහකත්වයට අදාල රු.6,507,500 (USD 50,000) ක තුන්වන වාරිකය 2014 සැප්තැම්බර් 01 දින හෝ ඊට පෙර ගෙවිය යුතු වුවද අදාල මුදල සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අදාල සමාගමෙන් අයකරගෙන නොතිබුණි.

(ඇ) පාසල් ක්‍රිකට් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය අරමුදල් රැස් කිරීමට, 2014 ජනවාර් 14 දින ඩුබායිහි ක්‍රියාත්මක කර තිබූ වැඩසටහනට අදාලව එක්සත් අරාබි එමිරේට්ස්හි ක්‍රිකට් මණ්ඩලය සමග ලිඛිත ගිවිසුමක් අත්සන් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපොහොසත් වී තිබූණු අතර අදාල පාර්ශවයන් ගෙන් අයවිය යුතු රු.1,372,085 (USD 10,494) ක මුදල 2015 ජනවාර් 31 දින වන විටද අයකරගෙන නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයට අදාලව පැවැත්වීමට තීරණය කර තිබූ ක්‍රිකට් තරගවලට පරිබාහිරව ලබාගෙන තිබූ සංචාරක ක්‍රිකට් තරග දෙකකින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට රු.68,395,349 ක පාඩුවක් සිදුවී තිබුණු අතර අදාල තරග දෙකෙන් රු.51,155,618 ක ඇස්තමේන්තුගත අලාභයක් සිදුවන බවට පූර්ව ගණනය කර තිබියදී තරග ලබාගෙන තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති ජාත්‍යන්තර තරගාවලි වෙනුවෙන් රු.517,991 ක් වැයකර ටිකට්පත් 295,517 ක් මුද්‍රණය කර තිබුණද, තරගාවලි පැවැත්වීමට තීරණය කර තිබූ ස්ථාන පසුව වෙනස් කිරීම හේතුවෙන් ටිකට්පත් 149,833 ක් හෙවත් සියයට 50 ක් අලෙවි කර ගැනීමට නොහැකි වී තිබුණි.

### 5.3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------

ආයතනය සිදු කර තිබුණු පහත සඳහන් ගනුදෙනු මතභේදාත්මක විය.

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් අනුමත ණය යෝජනා ක්‍රමයක් නොමැතිව හා ණය ආරක්ෂණ ලබාගැනීමෙන් තොරව ආයතනයේ සේවකයින් 73 දෙනකුට (කොන්ත්‍රාත් සේවකයින් හා විධායක කමිටු සාමාජිකයින්ද ඇතුළත්ව) පොළී රහිත ණය ලබාදී තිබුණි. තවද ණය සඳහා අයවැය ප්‍රතිපාදනද සළසා නොතිබුණි. 2014 වර්ෂය අවසාන වන විට රු.14,811,018 ක හිඟහිටි ණය ශේෂයක් (පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනා ශේෂයද ඇතුළත්ව) විය. ණය අයකර ගැනීමට අදාලව සුදුසු පාලනයන්ද ආයතනය විසින් හඳුන්වා දී නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේදී ක්‍රීඩා අවලංගු කිරීමේ හා අත්හැරීමට අදාල රක්ෂණ ආවරණයකට ගරු නොකිරීම නිසා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් රක්ෂණ සමාගමකට එරෙහිව රු.බිලියන 1.3 ක වන්දියක් ඉල්ලා නඩුවක් පවරා තිබුණි. 2014 වර්ෂය අවසාන වන විට අදාල නඩුව වෙනුවෙන් වැයකර තිබූ නීති වියදමරු.11,369,716 ක් විය.

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2012 ටී 20 ලෝක කුසලාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියාගේ සේවා ගිවිසුම ඒකපාර්ශ්වීව කඩකරමින් ඔහුව සේවයෙන් පහකර තිබුණු අතර ප්‍රධාන ආරක්ෂක නිලධාරියා විසින් රු.50,000,000 ක වන්දියක් ඉල්ලා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට එරෙහිව නඩුවක් පවරා තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් අදාල නඩුව වෙනුවෙන් රු.303,350 ක නීති වියදමක් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නඩුවේ තීන්දුව ලබාදී නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් නීති කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන තිබුණද, නීති සේවා ලබා නැනීම වෙනුවෙන් නීති උපදේශක කමිටුවේ සමාජිකයකුට රු.600,000 ක් හා ලංකා සේවා නියුක්තයින්ගේ සම්මේලනයට රු.389,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී නීති කාර්ය මණ්ඩලයේ වැටුප් වෙනුවෙන් රු.3,111,960 ක්ද වැයකර තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ පැවති ක්‍රිකට් නිලවරනයට එරෙහිව, බාහිර පාර්ශ්වයන් විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට එරෙහිව පවරා තිබූ නඩු වෙනුවෙන් 2014 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් රු.18,281,073 ක නීති වියදමක් කර තිබුණි. පසුව දෙපාර්ශ්වය විසින්, වැය කර තිබුණු නීති වියදම් ඒ ඒ පාර්ශ්වයන් විසින් දරා ගැනීමේ එකගත්වය මත නඩු ඉවත්කරවා ගෙන තිබුණි. එහෙත් එම නඩු ඉවත්කර ගැනීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ටිකට්පත් හා අනිකුත් ද්‍රව්‍ය මුද්‍රණය කිරීමට අදාළව මිල කැදවීම් කිරීමේදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලියාපදිංචි ප්‍රසිද්ධ හා පළපුරුදු මුද්‍රණකරුවකුගෙන් මිල කැදවීම් කර නොතිබුණි. ඒ හේතුවෙන් තෝරාගත් සැපයුම්කරුට රු.762,144 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(උ) ශ්‍රී ලංකා ප්‍රීමියර්ලීග් (එස්එල්පීඑල්) - 2012 වෙනුවෙන් පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු. 11,409,170 ක් විධායක කමිටුවේ අනුමැතිය මත බොල්ණය ලෙස කපාහැර තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2008 වර්ෂයේදී ක්‍රීඩා සමාජයකට ලබාදී තිබූ රු.මිලියන 15 ක ණය මුදලෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ රු.5,022,704 ක ණය

ශේෂය හා රු.2,861,149 ක ලැබිය යුතු ණය පොලිය විධායක කමිටුවේ අනුමැතිය මත බොල්ණය ලෙස කපාහැර තිබුණි.

## 5.3.8 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයන් බඳවාගැනීම් පරිපාටියක් හා බඳවා ගත යුතු සේවක සංඛ්‍යාව කොපමණද යන්න අනුමත කර නොගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී සේවකයින්ගේ වැටුප් හා දීමනා වෙනුවෙන් රු. 392,011,529 ක් වැයකර තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී හා 2014 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂික බැඳීම් පිළිවෙලින් රු.37,298,715 ක් හා රු.42,911,160 ක් විය. පසුගිය වර්ෂය හා සැසඳීමේදී, සමාලෝචිත වර්ෂයේ සියයට 15.5 ක සේවක පාරිතෝෂික බැඳීම් වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අනුමත සේවක බඳවාගැනීම් හා උසස්වීම් පරිපාටියකින් තොරව සේවකයින් 216 කට ලබාදී තිබූ එකතුව රු.26,728,116 වැටුප් වර්ධක බලපා තිබුණි.

(ඇ) සමහර කොන්ත්‍රාත් සේවකයින්ගේ සේවා ගිවිසුම් අවසන් වී තිබුණද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ඔවුන්ට අනුමැතියකින් තොරව සේවයේ රැඳී සිටීමට අවස්ථාව ලබාදී තිබුණි.

## 5.3.9 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කරනු වෙනුවට එම කාර්යයන් අභ්‍යන්තර විගණනය වෘත්තියේ යෙදී සිටින ආයතනයකට 2012 ජූලි 12 දින සිට පවරා තිබුණි.